දුරකථන ) 0112669192,0112675011
தொலைபேசி ) 01126940330112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXW/05/2025

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය ) 2024/12/31
திகதி )
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media


**පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 – 02/2025**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල - කොළඹ,

අධ්‍යක්ෂ - ජාතික රෝහල - මහනුවර,

අධ්‍යක්ෂ - ජාතික රෝහල - ගාල්ල,

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානින් වෙත.

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය (නීති නිලධාරි) SL - 1 - 2006 වැටුප් පරිමාණය නියම කර ඇති තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2025 (පළමු වාරය)</u>**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය SL – 1 - 2006 වැටුප් පරිමාණය නියමකර ඇති නීති නිලධාරි III ශ්‍රේණියට පත් කර වසර 03 ක් ඇතුළත සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් **2025.02.02** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02 සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය SL – 1 - 2006 වැටුප් පරිමාණය නියමකර ඇති නීති නිලධාරියෙකු ලෙස පත්වීමක් ලබා, මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

**03 අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් කොළඹ – 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385 "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අධ්‍යක්ෂ (විභාග) වෙත **2025/01/15** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර **"නීති නිලධාරි (SL - 1 - 2006) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2025 (පළමු වාරය)"** ලෙස සඳහන් කල යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියා විසින්ද, සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමග **රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් එවිය යුතුය.** ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**04 විභාග ගාස්තු**

4.1 විභාගයට පළමු වරට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයයකට රු.25.00 බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

4.2 කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

**05 විභාගයට ඇතුලත් කර ගැනීම**

5.1 පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශ පත්‍ර නිකුත්කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

5.2 විභාග අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් භාරගනු ලැබේ.

[අ] ජාතික හැඳුනුම්පත

[ආ] සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය

[ඇ] වලංගු රියදුරු බලපත්‍රය

[ඈ] වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06 විභාග පරිපාටිය**

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, ආයතන රෙගුලාසි සහ මුදල් රෙගුලාසි යනුවෙන් ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කරනු ඇත. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයන් සඳහා අයදුම් කළ යුතුය.

**07 විභාග විෂය නිර්දේශ මාලාව**

07.1 ආයතන රෙගුලාසි ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 01කි. මෙම ප්‍රශ්න පත්‍රය රචනා මාදිලියේ ප්‍රශ්න 06 කින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

**විෂය නිර්දේශය:-**

- **ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත සැකසේ.**
  - II වන පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි සහ පත්කිරීම්
  - IV වන පරිච්ඡේදය - මාරුවීම්, තාවකාලික තත්ත්වය, ස්ථිර තත්ත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම
  - V වන පරිච්ඡේදය - මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම
- **ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**
  - VII වන පරිච්ඡේදය - වැටුප්
  - VIII වන පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා
  - XII වන පරිච්ඡේදය - නිවාඩු
  - XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර
- **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.**

07.2 මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය (කාලය පැය 01 යි)

මෙම ප්‍රශ්න පත්‍රය රචනා මාදිලියේ ප්‍රශ්න 06 කින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

**විෂය නිර්දේශය:-**

❖ මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද

- I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු
- II වන පරිච්ඡේදය - වියදම්, අත්තැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාරී බලය
- III වන පරිච්ඡේදය - මුදල් පාලනය හා ගිණුම් ගතකළ හැකිවීම
- IV වන පරිච්ඡේදය - ලැබීම්
- VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්
- VIII වන පරිච්ඡේදය - අත්තිකාරම් ගිණුම්

❖ **රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය**

**08 විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු අදාල නිලධාරීන්ගේ දැන ගැනීමට සලස්වන්න. (මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.)

සැ.යු. **විභාග චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බල පැවැත්වේ.**

යූ ඒ එස් එච් සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

යූ.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ 10

EXW

| කාර්යාලිය ප්‍රායෝජනය සඳහා |
|---|
| |

## ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක සේවා ගණය (නිති නිලධාරි) SL – 1 – 2006 වැටුප් පරිමාණය නියම කර ඇති තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2025 (පළමු වාරය)**

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................

..............................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..............................................................

..............................................................

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) (i) මුල් පත්වීමේ දිනය හා ලිපි අංකය ..............................................................

(ii) දැනට ලැබෙන වාර්ෂික වැටුප ..............................................................

(iii) ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

(iv) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

(v) විද්‍යුත් ලිපිනය :..............................................................

02 ඔබ පෙනී සිටින විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

ආයතන රෙගුලාසි ☐ මුදල් රෙගුලාසි ☐

03 (අ) දැනට සේවය කරන ආයතනය (සිංහල) ..............................................................

(ඉංග්‍රීසි ) ..............................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ මධ්‍යම රජයට ☐ පළාත් සභාවට ☐

(ඇ) සේවය කරන ආයතනය අයත් දිස්ත්‍රික්කය ..............................................................

(ඈ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද?..............................................................

(ඉ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ..............................................................

..............................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ..............................................................

..............................................................

04 විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) ..............................................................

05 (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද ......................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේනම්? මුද්දර අලවා තිබේද? ...............................

| මුද්දර කොටුව |
|---|

---

**06. අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි

(i) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු...... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශයේ විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකගවන බවත් සහතික කරමි.

දිනය ..................... ..............................

අයදුම්කරුගේ අත්සන

---

**07. පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය**

මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර/පසු මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය............ ...............................

නම සහ අත්සන

---

**08. ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..................................................මහතා/ මහත්මිය/ මෙනවිය ..................................

නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / නොවන බවත්, රු.............ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

දිනය ...................... ..............................

ආයතන ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

---

**09. විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

..................................................මහතා/ මහත්මිය/ මෙනවිය, ..................................

නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත් අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .........................

..............................

විමධ්‍යගත කොට්ඨාශ
විශේෂිත ව්‍යාපාර
ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]